# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,931/8 — 1970 නොවැම්බර් 11 වැනි බදාදා — 1970.11.11

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි.)


# IV වැනි කොටස – පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### නගර සභා ආඥාපනත

**184 වැනි වගන්තිය යටතේ ආඥාව**

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 184 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති ෆිලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, වවුනියාව නගර සභාව සම්බන්ධයෙන්—

(අ) එකී ආඥාපනතින් පැවරී ඇති රාජකාරි කටයුතු ඉටු කිරීම වුවමනාවෙන්ම පැහැර හැරීම හෝ එම රාජකාරි කටයුතු ඉටු කිරීමෙහිලා විෂමාචාරයෙන් කටයුතු කිරීම;

(ආ) අදක්ෂතාවය හා අයථා පාලනය, සහ

(ඇ) එකී ආඥාපනතින් පැවරී ඇති බලතල අයථා අන්දමින් පරිහරණය කිරීම

යන මේවා ඔප්පු වන ප්‍රමාණවත් සාක්ෂි තිබෙන බවට සෑහීමට පත්ව, මෙම ආඥාවෙන්—

(අ) වවුනියාව නගර සභාව විසුරුවා හරිමි. තවද,

(ආ) ඒ නගරය සඳහා එකී ආඥාපනත යටතේ අළුත් නගර සභාවක් සංස්ථාපනය කරගන්නා තුරු, වවුනියාව නගරයේ කටයුතු පාලනය කිරීම පිණිස ද, ඒ කාර්යය සඳහා එකී ආඥාපනත යටතේ නගර සභාවක බලතල ක්‍රියාවෙහි යෙදවීම සහ යුතුකම් ඉටු කිරීම පිණිස ද, විශේෂ කොමසාරිස්වරයා වශයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් කනගනායගම් නල්ලයිනාදන් මහතා පත් කරමි.

1970 නොවැම්බර් මස 11 වැනි දින,
කොළඹ දී ය.

ෆී. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති.

11–613


ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.

806/3—ජෙ 18226—5,675 (70/11)